# ශ්‍රී ලංකාව තුළ සූක්ෂම වී වගා ක්‍රමය (ශ්‍රී වගා ක්‍රමය)

ශ්‍රී වගා ක්‍රමය යනු කුමක්ද? ලෝකයේ වී වගා කරනු ලබන සාම්ප්‍රදායික ක්‍රම කිහිපයක් පවතී. ශ්‍රී වගා ක්‍රමය යනු එම සාම්ප්‍රදායික මුහුණුවරින් මදක් වෙනස් වූ, අවම සම්පත් ප්‍රමාණයක් උපයෝගී කර ගනිමින්, වැඩි අස්වැන්නක් ලබා ගත හැකි නවතම සොයා ගැනීමකි. එනම්, නව වී ගොවිතැන් තාක්ෂණයකි (සුබසිංහ, ආරියරත්න, 2002) 'ශ්‍රී' (SRI) යන කෙටි වචනය, බිහි වී ඇත්තේ System of Rice Inetensification යන ඉංග්‍රීසි වචන පෙළක මුලකුරු භාවිතයෙනි. එය සිංහල භාෂාවෙන් හඳුන්වනු ලබන්නේ සූක්ෂම වී වගා ක්‍රමය යනුවෙනි. අසූව දශකයේ මුල් භාගයේ දී එනම්, 1980 දී පමණ Fr. Henri de Lavlani නම් ප්‍රංශ ජාතික පියතුමකු විසින් මැඩගස්කරයේ ගොවීන් පිරිසක් සමඟ සමීපව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී වගා ක්‍රමය, ලොවට බිහි විය. ශ්‍රී වගා ක්‍රමය ඉතා සරල වූ නමුත් සම්පත් උපයෝගීතාව පිළිබඳ සැලකිලිමත් වන විට සාම්ප්‍රදායික ක්‍රමවලින් තරමක් දුරට වෙනස් වූ ක්‍රමයකි. එහි දී, කැපී පෙනෙන ලක්ෂණ වන්නේ, අවම ජල ප්‍රමාණයක්, අඩු බිත්තර වී ප්‍රමාණයක් සහ මුළුමනින්ම කාබනික පොහොර මත රඳ පවතින කෘෂි රසායන අවම/භාවිතා නොවන සහ සාපේක්ෂව වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකිවීම යන කරුණු වේ. එබැවින්, ශ්‍රී ක්‍රමය පරිසර හිතකාමී ක්‍රමයක් ලෙසින් ප්‍රචලිත වී ඇති අතර මෙම ක්‍රමයට වී වගා කිරීමෙන් සාමාන්‍ය ක්‍රමයට වී වගා කිරීමෙන් ලැබෙන අස්වැන්නට වඩා දෙගුණයක් අස්වැන්න ලබා ගත හැකි බව සඳහන් වේ. (ඔක්ස්ෆෑම් ඕස්ට්‍රේලියා, 2008)

ශ්‍රී වගා ක්‍රමයේ දී මූලික ක්‍රියවලි 06ක් පිළිබඳ සැලකිලිමත් වේ. එම ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනය කිරීමේ දී සාමාන්‍ය වී වගාව සිදු කරන ක්‍රමයන්ට වඩා වෙනස්කම් වලින් යුක්ත බව පෙනී යයි.

## 1. පැළ සිටුවීම

මෙම වගා ක්‍රමයේ දී ප්‍රධාන වශයෙන් ම පැළ සිටුවීම (Tranaplanting) සිදු කෙරේ. එහි දී, වී බීජ තවාන් දැමීමක් සිදු කරනු ලබන අතර දින 08-15ත් අතර වූ කුඩා නිරෝගී පැළ සිටුවීමට යොදා ගනී. එනම්, මුල්ම පත්‍ර දෙක හටගත් පැළයි. තවාන දැමීමේ දී ද, මඩ තවාන වඩාත් යෝග්‍ය වේ. එය නිරතුරුව ම තෙත් ව තැබිය යුතු වුවත්, කිසිම විටෙක ජලය රඳා තැබීම (Flooded) සිදු නො කෙරේ. සාමාන්‍යයෙන් තවාන් දැමීම සඳහා 50-100 Kg/ha පමණ බිත්තර වී ප්‍රමාණයක් ප්‍රමාණවත් වේ.

## 2. සිටුවීම සඳහා පැළ තවානෙන් වෙන් කර ගැනීම

පැළ සිටුවීමේ දී පැළයේ මුල් පද්ධතියට හානි නොවන ආකාරයට ඒවා තවානෙන් ගලවා ගත යුතුය. එහි දී, එක් පැළයක් වෙන් කර ගත යුත්තේ එහි බීජය, පස් කුඩා ප්‍රමාණයක් හා තෙත්ව පවතින ආකාරයටය. කුඩා වී පැළය ක්ෂේත්‍රයේ සිට වූ පසුව එහි සථාවරවීමට යම් කාලයක් ගත වන බැවින් එතෙක් එහි වර්ධනයට අවශ්‍ය ශක්තිය/ආහාර ලබා ගැනීමට පැළය ගලවා ගන්නා අවස්ථාවේදී බීජ පැස (Seed Sac) තිබීම අත්‍යාවශ්‍ය වේ. පැළ සිටුවීම කළ යුත්තේ, ඒවා ගලවා ගත් පසු හැකි අවම කාලයකිනි. එය පැය භාගයකට හෝ විනාඩි 15ක් අතර කාලයකට සීමා කළ යුතුය. පැළ සිටුවීමේ දී ද, එහි මූලය තිරස්ව සිටින සේ ද පැළය සිරස්ව සිටින සේ ද සිටුවීම කළ යුතු ය. එවිට, මූලයේ අග්‍රස්ථයට හානිවීමකින් තොරව සිටුවිය හැකි ය. තව ද, පැළ සිටුවීමේ දී ඒවා සෙ.මී. 1-2 පමණ ගැඹුරට සිටුවීම ප්‍රමාණවත් ය (නො ගැඹුරුව).

## 3. පැළ අතර පරතරය

පැළ සිටුවීමේ දී ඒවා අතර පරතරය සාපේක්ෂව වැඩි වන අතර සාමාන්‍යයෙන් එය 25cm x 25cm පමණ වුවකි. පැළ සිටුවීමට ප්‍රථම එම ස්ථානය හඳුනා ගැනීම සඳහා ඒ සඳහා ම සකසන ලද රේක්කයක් වැනි උපකරණයකින් 25cm x 25cm දුර සීමා සලකුණු කරනු ලැබේ. එහි දී, ක්ෂේත්‍රයේ කොටු ආකාරයේ පෙනුමක් දිස්වන අතර එම කොටුවල කොන් 4 තුළ, පැළ සිටුවනු ලබයි. එහි දී, එක් කොනකට (මුල්ලකට)/ ස්ථානයකට එක් පැළයක් සිටින සේ සිටුවීම කළ යුතුය. බීජ වැපිරීමට වඩා පැළ සිටුවීමේ දී අවශ්‍ය වන බිත්තර වී ප්‍රමාණය අඩු වන

බව ඉන් පැහැදිලි වේ. පැළ අතර පරතරය වැඩි බැවින් සූර්යාලෝකය, පසේ පෝෂණය හා වාතය උපරිම ලෙස උකහා ගත හැකි බැවින් හොඳින් පඳුරු දමමින් පැළ වැඩෙයි. එසේ ම පැළ අතර පරතරය වැඩි නිසා වල් මර්ධනයට ද පහසු වේ.

**4. පැළ සිටුවීමෙන් පසු ක්ෂේත්‍රයට ජලය සැපයීම**

සිටුවා දින 28ක් පමණ වන තෙක් ක්ෂේත්‍රයේ පසේ තෙතමනය පවතින තරමට පමණක් ජලය ලබා දිය යුතුය. මෙහි දී, දිනක් ඇතුළත ජලය හරවා තබා නැවත කඩා දමයි. නැවත ජලය හරවා තබන්නේ ඉරි තලන මට්ටමට වියළී ගිය පසුව ය. (මෙහි අරමුණ වන්නේ වර්ධන අවස්ථාව තුළ දී ගොයම් මුල්වලට හා පාංශු ජීවීන්ට අවශ්‍ය ජලය හා ඔක්සිජන් සැපයීම ය). එබැවින්, තෙත් හා වියළි යන තත්ත්ව දෙක ම පවත්වා ගත යුතුය. මෙහි දී, ජලය යෙදීම සවස් කාලයේ සිදු කොට උදයේ දී ජලය කඩා හැරිය හැකි ය. මෙමඟින් පස මත ජලය පිටාර ගැලීම සිදු නො කිරීමෙන් දිවා කාලයේ දී පසට සූර්යාලෝකය හා වායුගෝලයෙන් ඔක්සිජන් අවශෝෂණය කර ගැනීමටත් ඉඩ සැලසේ. පැළ සිටුවා දින 28ට පසු එනම්, කරල් හර ගන්නා අවධියේ (ප්‍රජනක කාලය) සිට කරල් පීදී දින 15ක් ගත වන තුරු ජලය ඇත්නම් රඳවා තැබීම කළ යුතු ය. ඉන් පසු ජලය ඉවත් කළ යුතු ය.

**5. වල් මර්ධනය**

වල් පැළෑටි මර්ධනය කිරීම ද ශ්‍රී වගාවේ ප්‍රධාන කාර්යයන් අතර වැදගත් වේ. එහි දී, රසායනික වල් නාශක යොදා නො ගන්නා අතර යාන්ත්‍රික ක්‍රමයට වල් මර්ධනය කෙරේ. මේ සඳහා වීඩරයක් භාවිතා කළ හැකි වන අතර එය පැළ අතර පරතරයට සමාන අයුරින් සකසා තිබේ. වීඩර කිරීමේ දී පැළ පේළි 2ක් අතර ඉදිරියට හා පසු පසට කිරීමේ දී වල් පැළ ගැලවී යන අතර පස වාතනය වීමක් ද, පස බුරුල් වීමක් ද (වීඩරයේ දති නිසා) පැළ මුල්වලට පස් එකතුවීමක් ද සිදු වේ. මෙමඟින් ද පැළවල වර්ධනය ශීඝ්‍ර වේ. වල් මර්ධනය සාමාන්‍යයෙන් 3-4 වතාවක් සිදු කළ යුතු අතර එය පැළ සිටුවා දින 5, 10, 15 හා 20 යන කාලවල දී සිදු කළ හැකි ය. සාමාන්‍ය වී වගා ක්‍රමයට වඩා වැඩි ශ්‍රමයක් මෙහි දී වැය වන බව බොහෝ විද්වතුන්ගේ මතයයි.

**6. පොහොර යෙදීම**

කාබනික පොහොර යෙදීම ද ශ්‍රී වගා ක්‍රමයේ වැදගත් කොටසකි. රසායනික පොහොර යෙදීමක් සිදු නොවන අතර පිදුරු සහ සාදගත් කොම්පෝස්ට් පොහොර යෙදීම සිදු වේ. මෙහි දී, බිම් සකස් කිරීමේදීත්, පැළ සිටුවා කිහිප අවස්ථාවක දී කාබනික පොහොර යෙදීම කළ හැකිය. මෙමඟින් වස විසවලින් තොර හොඳ සහල් අස්වැන්නක් ලබා ගැනීමට මඟ පෑදෙන බව සඳහන් වේ. ශ්‍රී ක්‍රමයට වී වගා කිරීම මුලින්ම ආරම්භ කළ කුඹුරකට කාබනික පොහොර හා රසායනික පොහොර 50:50 ලෙස මුල්ම කන්නයේ යොදන අතර දෙවන කන්නයේ දී එම ඉඩමට කාබනික පොහොර 75%ක් හා රසායනික පොහොර 25%ක් ලෙස යොදනු ලබයි. එම ඉඩමේ ම ශ්‍රී ක්‍රමයට තුන්වන කන්නයේ වගා කිරීමේ දී 100%ක් ම කාබනික පොහොර යොදා ගැනේ.

## ශ්‍රී ලංකාව තුළ ශ්‍රී වගා ක්‍රමය පැතිර යාම

1998 වර්ෂයේ ගල්ඔය ප්‍රදේශයේ ගොවීන් කේන්ද්‍ර කොට ගනිමින් පවත්වනු ලැබූ රැස්වීමක් හරහා මුල්වරට ශ්‍රී වගාව පිළිබඳව හඳුන්වාදීමක් සිදු කරන ලද්දේ මහාචාර්ය නෝමන් අප්හොෆ් (Norman Uphoff) මහතා විසිනි. ඉන් පසුව, මෙම තොරතුරු හා දැනුම කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය සමඟ හුවමාරු කර ගන්නා ලදී. එහි දී, අමාත්‍යාංශ නිලධාරීන් (ආචාර්ය ගාමිණී බටුවිටගේ) මෙම අදහස සමඟින් කාබනික ගොවිතැනෙහි යෙදෙන ගොවියකු වන එච්.එම්. ප්‍රේමරත්න මහතා සමඟ කණ්ඩායම් ගත වන ලදී.

මෙහි දී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රමය හඳුන්වා නොදුන් අතර බොහෝ රජයේ පර්යේෂකවරුන් පවා මෙම ක්‍රමය වී වගාවේ ජීව විද්‍යාත්මක මට්ටම අභිබවා අස්වැන්නක් ලබා දෙන්නේ ද යන සැකමුසු ආකල්පයකින් පසු විය. විශේෂයෙන් රාජ්‍ය නොවන ආයතන ශ්‍රී ක්‍රමය විවිධ දිස්ත්‍රික්ක වල වූ ගොවීන් අතර ප්‍රචලිත කිරීමට අවධානය යොමු කරන ලදී. රාජ්‍ය ආයතන ද වරින් වර ශ්‍රී ක්‍රමය පිළිබඳ ඇගයීම් සිදු කොට තිබේ. ඒ අනුව, 2002 වර්ෂයේ දී ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය

මගින් (IWMI) ශ්‍රී ලංකාවේ ශ්‍රී වගා ක්‍රමය පිළිබඳ ඇගයීමක් සිදු කරන ලද අතර වර්තමානය දක්වාත් විවිධ වූ සංවිධාන සහ ආයතන මගින් ශ්‍රී වගාව ව්‍යාප්ත කරවීමේ ක්‍රියාවලියට දායක වී සිටින බව පෙනී යයි.

ශ්‍රී වගා ක්‍රමය ගොවීන් අතර ප්‍රචලිත කිරීමේ පුරෝගාමීන් ලෙස රාජ්‍ය නොවන සංවිධාන පෙන්වා දිය හැකි අතර ග්‍රාමීය මට්ටමේ විවිධ ප්‍රජා සංවිධාන ද මේ සඳහා දායක වී සිටී. රාජ්‍ය නොවන සංවිධාන අතර ඔක්ස්ෆෑම්, වර්ල්ඩ්විෂන්, මර්සිකෝප්, ඉදිරියෙන් සිටින අතර 'ජනඅරුණ' පදනම, විකල්පනී කාන්තා සංවිධානය, සේවා ලංකා ආයතනය වැනි සංවිධානාත්මක ආයතන ද ඒ අතර වේ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ද මහනුවර දිස්ත්‍රික්කයේ මාරස්සන වැනි ගොවිජන සේවා මධ්‍යස්ථානවල නොවන සංවිධාන සහ අනෙකුත් ප්‍රජා සංවිධාන ද එහි සඳහන් වේ.

ඉහත දක් වූ ආයතන හා සංවිධාන මගින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ඉලක්ක කරන ලද ගොවි කණ්ඩායම්වලට ශ්‍රී වගා ක්‍රමයේ ක්‍රියාවලිය ගැන පුහුණුවීම් ලබාදීමට කටයුතු කරන අතර ගොවීන්ගේ වගා ක්ෂේත්‍රයට පැමිණ ඒ ඒ අවස්ථාවේ වගාවේ තත්ත්වය පරීක්ෂා කොට පසුව කළ යුතු පියවරයන් ගැන පැහැදිලි කිරීම් ද සිදු කොට ඇත. සමහර ප්‍රදේශවල පුහුණුව ලබාදීමට යෙදවූ නිලධාරීන් පවා ගොවීන් සමඟ ක්ෂේත්‍ර මට්ටමේ දී ප්‍රායෝගිකව කටයුතු කරන බව සඳහන් වේ. න්‍යායාත්මක පුහුණුවේ දී අත් පත්‍රිකා සහ ඡායා පිටපත් කරන ලද රූප සටහන් ආදී සාමාන්‍ය ජනයාට තේරුම් ගැනීමට පහසුවන මාර්ග ඔස්සේ දැනුවත් කිරීම් සිදු කොට ඇති

**ශ්‍රී ලංකාවේ 'ශ්‍රී' ක්‍රමයට වී වගාකරන දිස්ත්‍රික්ක, අක්කර ප්‍රමාණය සහ ගොවීන් සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | සංවිධානය | ශ්‍රී වගා ක්‍රමය භාවිත අක්කර ප්‍රමාණය | ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| කෑගල්ල | ඔක්ස්ෆෑම් ආයතනය | 14 | 46 |
| මාතර | ඔක්ස්ෆෑම් සහ ගැමිදිරිය | 15.5 | 31 |
| මහනුවර | කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව | 8 | 60 |
| ගම්පහ | වෙනත් ප්‍රජා සංවිධාන | 14 | 24 |
| කොළඹ | සමූපකාර පාරිසරික පදනම | 06 | 08 |
| අනුරාධපුර | ඔක්ස්ෆෑම් | 20 | 45 |
| පොළොන්නරුව | ඔක්ස්ෆෑම් | 21 | 34 |
| අම්පාර | ඔක්ස්ෆෑම් සහ සේවා ලංකා | 3.75 | 07 |
| හම්බන්තොට | ඔක්ස්ෆෑම්, ජනඅරුණ පදනම, මර්සිකෝප්, ගැමිදිරිය | 157 | 325 |
| මොණරාගල | වර්ල්ඩ් විෂන්, විකල්පනී කාන්තා සංවිධානය | 9.5 | 20 |
| ත්‍රිකුණාමලය | විකල්පනී කාන්තා සංවිධානය | 01 | 02 |
| පුත්තලම | වර්ල්ඩ් විෂන් සහ සේවා ලංකා | 68 | 97 |
| කුරුණෑගල | වෙනත් ප්‍රජා සංවිධාන | 46 | 60 |
| **එකතුව** | | **383.75** | **756** |

*මූලාශ්‍රය : Sri Neytwork, Oxfam Australia, 2008*

මෙම ශ්‍රී ක්‍රමය අත්හදා බලමින් සිටින බව පෙනී යයි. ශ්‍රී වගා කරන දිස්ත්‍රික්ක හා ගොවීන් සංඛ්‍යාවන්, භූමි ප්‍රමාණයන් හා ඒ සඳහා මැදිහත් වන රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සංවිධාන පිළිබඳ තොරතුරු එක්කර ශ්‍රී නෙට්වර්ක් (Sri Net Work) නමින් තොරතුරු පද්ධතියක් ද පවත්වාගෙන යනු ලබයි. එම තොරතුරුවලට අනුව පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ශ්‍රී වගා කරන දිස්ත්‍රික්ක, අක්කර ප්‍රමාණය සහ ගොවීන් සංඛ්‍යාව වන අතර ශ්‍රී වගා ක්‍රමය ප්‍රචලිත කිරීමට දායක වන රාජ්‍ය අතර එම සංවිධාන මගින් ශ්‍රී වගාවට අවශ්‍ය වන විශේෂ වූ උපකරණ පවා නොමිලේ බෙදා දීමක් ද සිදු කොට තිබේ. ඒ අතර වීඩරය, රේක්කය වැනි උපකරණ දැක්විය හැකිය. ඊට අමතරව මුල් අවස්ථාවේ වගාව ආරම්භ කිරීමට මුදල් ආධාර උදළු තල, බිත්තර වී, කාබනික පොහොර මළු, කොහොඹ ඇට, කෘමිනාශක පැකට් යනාදිය ද ලබාදී ඇත. මෙම ආධාර සපයා ඇත්තේ සීමිත ඉඩම් ප්‍රමාණයකට වීම ද විශේෂත්වයකි. උදාහරණ ලෙස හම්බන්තොට වැනි මහා වාරි දිස්ත්‍රික්කයන් හි ශ්‍රී වගා ආධාර ලබා

දී ඇත්තේ අක්කර 1/2 ක් වූ ඉඩම් ප්‍රමාණයකට වේ. පුහුණු කිරීමේ ක්‍රියාවලීන්, අදියරයන් කිහිපයකට සිදු කරනු ලබන අතර මුල් අවස්ථාවේ ඉතා අඩු පිරිසකටත්, පසුව ගොවීන්ගේ උනන්දුව මත වැඩි පිරිසකටත් යන ආකාරයට පුහුණුවීම් පවත්වා තිබුණි.

## "ශ්‍රී" වගා ක්‍රමය භාවිතයෙන් ලැබෙන වාසි හා අවාසි

ශ්‍රී වගා ක්‍රමය භාවිතා කිරීමෙන් ගොවියාට වාසිදායක තත්ත්වයක් ඇති බව සඳහන් වන අතර ඉන් යම් යම් අවාසිදායක තත්ත්වයන් ද ඇති වන බව පෙනේ. වැඩි අස්වැන්නක් ලබා ගත හැකිවීම නිසා ගොවියාට ලැබෙන ආර්ථික වාසිය ඉහළ යාම, එසේම අවම ජල ප්‍රමාණයක් මුල් අවස්ථාවල දී යොදා ගන්නා නිසා සාම්ප්‍රදායික වී වගා ක්‍රමයේ දී අවශ්‍ය වන ජල ප්‍රමාණයෙන් අඩක් භාවිතා කිරීමෙන් මෙය සිදු කළ හැකි නිසා විශේෂයෙන් ම, ජලය හිඟ ප්‍රදේශවලට උචිත ක්‍රමයක් වීම, පැළ සිටුවීමේ දී ඒවා අතර පරතරය වැඩි නිසා අවශ්‍ය වන පැළ ප්‍රමාණය අඩු වන බැවින් අඩු බිත්තර වී ප්‍රමාණයකින් වගාව සිදු කළ හැකි වීමත්, ඒ සඳහා යන වියදම ද මේ නිසා යම් ප්‍රමාණයකින් අඩු වේ. වැඩි දියුණු කළ වී ප්‍රභේද භාවිතා කළ විට සාපේක්ෂව වැඩි අස්වැන්නක් ශ්‍රී වගා ක්‍රමය යටතේ ලබා ගත හැකි වූව ද, සාම්ප්‍රදායික වී ප්‍රභේදවලින් හොඳ අස්වැන්නක් ලබා ගත හැකි වීම ද වාසියකි.

කෘෂි රසායන හා පොහොර යොදා නො ගන්නා නිසා පරිසර හිතකාමී ක්‍රමයක් ලෙස හඳුන්වා දිය හැකි අතර යොදන සියලුම ද නැවත ස්වභාවික ලෙස ප්‍රතිචක්‍රීකරණය ට බඳුන් වන බැවින් පරිසරයට අහිතකර යමක් එකතු නොවේ. එබැවින්, වත්මන් පරිසර හිතකාමී වගා ප්‍රවේශයන්ට මෙහි විභවතාවක් පැවතීම ද වාසියකි. එසේම, බාහිරින් යොදන යෙදවුම් ඉතා අවම මට්ටමක පවතින බැවින් සාම්ප්‍රදායික වී ගොවිතැනට සාපේක්ෂව මෙහි නිෂ්පාදන වියදම අඩු ය. අස්වැන්න ද දෙගුණයක් ලබා ගත හැකි නිසා සමස්තයක් ලෙස ගොවියාට ලැබෙන ආදයම වැඩි ය. වී කරලක් සැලකූ විට එහි බොල් වී ප්‍රතිශතය හා තුන්කාල් වී ප්‍රතිශතය ද ඉතා අවම ය. හොඳින් පිරුණු වී කරල් බොහෝමයක් එක් වී පැදුරකින් ලබා ගත හැක (Moreitller). එබැවින්, වී බුසලක් සහල් කිරීමේ දී සාපේක්ෂව ලැබෙන සහල් ප්‍රතිශතය ඉතා ඉහළවීම විශේෂ වාසියකි. වී ගොවිතැනේ දී ගුණාත්මකබවින් ඉහළ බීජ වී වලට ඇති හිඟතාවයට විසඳුමක් ලෙසින් මෙම ශ්‍රී ක්‍රමයේ වී යොදා ගැනීමේ විභවයක් පැවතීම ද වාසියකි. බොල් වී ප්‍රතිශතය අවම නිසා ගුණාත්මයෙන් ඉහළ බිත්තර වී ලෙස තබා ගැනීමේ හැකියාවක් පවතී. එමෙන්ම, රසායනික කෘෂි රසායන, පොහොර යෙදීමක් සිදු නොකරන බැවින්, අවසාන ඵලය ලෙස වස විසෙන් තොර ගුණාත්මක බවින් ඉහළ සහල් පරිභෝජනය කිරීමට හැකියාවක් උද වේ.

වී වගාවට වැය වන කාලය, සාම්ප්‍රදායික වී වගාවකට යන කාලයට වඩා සති 1-2 කින් අඩු වේ. එබැවින් බෝග චක්‍රය කෙටි වීමෙන් ඉක්මනින් අස්වැන්න නෙළා ගත හැකිය. නියර ශුද්ධ කරන ආකාරයට සහ පැල අතර පරතරය වැඩි බැවින් පළිබෝධ රෝග පැතිරයාම ද ශ්‍රී වී වගාවේ අවම මට්ටමක පවතී. විශේෂයෙන්ම, වගාවට හිතකර කෘමීන්ගේ පැවැත්ම තහවුරු වීමත්, හොඳින් සූර්යාලෝකය පැළ අතරට ලැබීමත් ඉහත සඳහන් කළ ක්‍රම මගින් සිදු වන බවත් දක්නට ලැබේ. ඒ අනුව කෘමිනාශක භාවිතය අවම වීම වාසියකි. ශ්‍රී වී වගාවේ පඳුරුවල හොඳ ශක්තිමත් ගැඹුරට විහිදුණු මුල් පද්ධතියක් පවතින බැවින් වර්ෂාව, සුළඟ, තාපය හා සීතලට ඔරොත්තු දීමේ හැකියාවක් පවතී. විශේෂයෙන්ම, තද සුළඟට ඉදිරියාමක් හෝ පෙරළී යාමක් සිදු නොවේ. ඒ අනුව මෙය ස්වභාවික උපද්‍රව්‍ය වලින් සිදු වන හානි අවම කර ගැනීමට සුදුසු ක්‍රමයකි. වීඩර් කිරීම මගින් පස බුරුල්වීමක් සිදු වන නිසා නිරතුරුවම පස හොඳින් වාතනය වීමක් සිදු වේ. තව ද, කාබනික පෙහොර යොදන නිසා ද පසේ දීර්ඝ කාලීන සරු බවක් ඇති වේ. මෙම ක්‍රියාවලි දෙක මගින් පසේ ක්‍ෂුද්‍ර ජීවී හා ජීව විද්‍යාත්මක ක්‍රියාකාරීත්වය වැඩිදියුණු වී හොඳ අස්වැන්නක් ලැබීමට මඟ පෑදේ. වර්තමානයේ දිනෙන් දින හායනයට ලක්වන කුඹුරු ඉඩම්වල සාඵල්‍යතාව වර්ධනය සඳහා මෙය උචිත ක්‍රමයක් විය හැකිවීම ද මෙම ක්‍රමයේ දී දකිය හැකි වාසියකි. විශේෂයෙන් ම වගා නො කොට නොසලකා හරින කුඩා ඉඩම් ප්‍රමාණ හිමි ගොවීන්ට මෙම ක්‍රමය ඉතා වාසිදායක විය හැකිය.

ඉහත සඳහන් වාසිදායක තත්ත්වයන් අතර ශ්‍රී ක්‍රමයට වගා කිරීමේ දී සිදුවන අවාසිදායක තත්ත්වය ද විවිධ වේ. ශ්‍රී වී වගා ක්‍රමයේ දී

තරමක් දුරට ශ්‍රමය වැඩි වශයෙන් අවශ්‍ය වන ක්‍රියාවලි කිහිපයක් පවතී. ප්‍රධාන වශයෙන් වීඩර් කිරීමේදි හා පැළ සිටුවීමේ දී අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීමේ ගැටලුවක් පවතී. මෙය මෙම ක්‍රමයේ අවාසියක් ලෙසින් සඳහන් කළ හැකිය. ශ්‍රමය සපයා ගැනීමට මාර්ග පැවතිය ද, විවිධ වූ කාර්යයන් සඳහා අවශ්‍ය නිපුණතාවයකින් යුත් ශ්‍රම බලකායක් සොයා ගැනීම අසීරු ය. උදහරණ ලෙස පැළ සිටුවීමට දන්නා ශ්‍රමිකයෝ සොයා ගැනීමට නොහැකිවීම දක්විය හැකිය. මහාවාරි හා සුළු වාරි යන වාරි ක්‍රම යටතේ ජලය ලබා ගන්නා කුඹුරුවල දී අවශ්‍ය දින වකවානුවල දී ජල කළමනාකරණය කිරීමේ ගැටලු පවතී. එසේම, කොම්පෝස්ට් පොහොර සපයා ගැනීමේ හා නිෂ්පාදනයේ ගැටලු ඇත. කොම්පෝස්ට් නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය දනුම හා අමුද්‍රව්‍ය හිඟවීම ප්‍රධාන ගැටලුවකි. සාමාන්‍ය වී වගා ක්‍රමයේ දී පැළ සිටුවීමක් සිදු නොකරන අතර ශ්‍රී ක්‍රමයේ දී පැළ සිටුවිය යුතු ය. එමෙන්ම වල් මර්දනය ද යාන්ත්‍රිකව හෝ සිදු කළ යුතු ය. මෙම කාර්යයන් සඳහා වැඩි ශ්‍රමයක් අවශ්‍ය නිසා බොහෝ ගොවීන් මෙම ක්‍රමයට වී වගා කිරීමට වැඩි කැමැත්තක් නොදක්වන බව ද පෙනෙන්නට තිබේ.

## සමාප්තිය

විවිධ වූ රාජ්‍ය නොවන සංවිධාන හා ස්වේච්ඡා සංවිධානවල මෙහෙයවී මෙන් අදළ ප්‍රදේශවල එක් කන්නයක් හෝ දෙකක් (අවම වශයෙන්) ශ්‍රී ක්‍රමයට වී වගා කොට ඇති බව පෙනේ. ශ්‍රී වගා ක්‍රමය පිළිබඳ මුල් කාලීන පුහුණුවීම් සඳහා සහභාගී වූ බොහෝ ගොවීන් ඉතා උනන්දුවෙන් වගා කටයුතු සිදු කර ඇති අතර විශේෂයෙන් ඒ සඳහා ලබාදුන් මුදල්මය හා ද්‍රව්‍යමය ආධාර ඊට ඉවහල් වූ බවක් සඳහන් වේ. බොහෝ ගොවීන් පුහුණුවේ දී ලබාදුන් පියවරයන් එලෙසම අනුගමනය කර ශ්‍රී ක්‍රමයට වගා කරන අතර සමහර ගොවීහු මෙතෙක් ඔවුන් අනුගමනය කළ සාමාන්‍ය ක්‍රමයට අදළ යම් යම් ක්‍රියාවලින් ද එකතු කොට වී වගා කටයුතු කරන බව පෙනේ. මේ සඳහා දයකව සිටින රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන් පවසන ආකාරයට ශ්‍රී ගොවිතැන සාර්ථකව සිදු කළහොත් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි ක්‍රමයකි. එසේ වුවත්, වැඩි අස්වැන්නක් ලැබීම ගැන සැලකූ විට, මෙම ක්‍රමය ශ්‍රී ලංකාව වැනි රටකට අතිශය සාර්ථක පියවරක් ලෙස පෙනී ගිය ද, ඒ සඳහා අවශ්‍ය වන මානව සම්පත් ප්‍රමාණය පිළිබඳ සලකන විට එම ක්‍රමයෙහි යම් අසාර්ථකත්වයක් පවතින බවට විද්වතුන් විසින් විවිධ මත පළ කර තිබේ. ගොවීන් මුල්වරට මෙය අත්හද බැලීමට යාමේ දී පැළ සිටුවීමට හා වීඩරය භාවිතා කිරීමට පුහුණුවක් ලබා නොතිබීම හේතුවෙන් ඒ සඳහා වැඩි කාලයක් හා ශ්‍රමයක් වැය වන බවත්, තව ද මුල් අවස්ථාවේ දී මුදල්මය හා ද්‍රව්‍යමය ආධාර ලබා දුන්න ද ඊළඟ කන්නයේ දී ශ්‍රී ක්‍රමයට වගා කිරීමට යාමේ දී සියලුම ද්‍රව්‍ය තමාටම සපයා ගැනීමට සිදු වීමෙන් ඒ සඳහා වැඩි ශ්‍රමයක් හා මුදලක් වැය වන බව ද තවත් අදහසක් ලෙසින් සඳහන් කළ හැකි ය.

ශ්‍රී ක්‍රමය සම්බන්ධයෙන් පවතින සියලු කරුණු ගොනු කිරීමේ දී පෙනී යන්නේ, ශ්‍රී ලංකාවේ වී වගා ක්‍රම අතරින් 'ශ්‍රී' වගා ක්‍රමය වර්තමානයේ පවතින ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමට උචිත පරිසර හිතකාමී ක්‍රමවේදයක් බවයි. එසේම, මෙම ක්‍රමය සම්බන්ධයෙන් විවිධ මතිමතාන්තර හා අදහස් ද පවතින බව පෙනී යන අතර ගොවීන් අතර ප්‍රචලිත කිරීමේ හැකියාව සොයා බැලීම කාලෝචිත ක්‍රියාවක් බව ද පෙනී යයි. අවම පිරිවැයක් යටතේ වැඩි ආර්ථික වාසියක් ලබා ගත හැකි බව පැවසෙන ශ්‍රී වගා ක්‍රමය කොතරම් ප්‍රමාණයකින් දනට ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත වී තිබේද? ප්‍රචලිත නොවන්නේ නම් ඊට බලපාන හේතු සාධක කවරේද? යන්න පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කිරීම හරහා පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන අතර රාජ්‍ය අංශයේ සේම රාජ්‍ය නො වන අංශයන් හි ද දයකත්වය තුළින් රටට ගැලපෙන ක්‍රමවේදයන් සොයා බැලීම හරහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සාක්ෂාත් කළ හැකි අතර පරිසර හිතකාමී වගා ක්‍රමයන් පිළිබඳ දැඩි උනන්දුවකින් කතා කෙරෙන මෙවන් වකවානුවක මෙම ශ්‍රී ක්‍රමයේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ විද්‍යාත්මකව සොයා බැලීම කාලීන වශයෙන් ඉතා උචිත කාර්යයක් වනු නො අනුමානය.

**සාගරිකා හිටිහාමු හා සුසිලා ලූර්දු**
පර්යේෂණ නිලධාරිණියන්
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය